# ස්වයං රැකියා වැඩ සටහන 'නිස්කෝ'

### ආරම්භය

මෙරට තරුණ පරපුර මුහුණ පා ඇති ප්‍රධාන ප්‍රශ්ණයක් වන විරැකියාවට එක් විකල්පයක් වශයෙන් ස්වයං රැකියා සංකල්පය තරුණයින් අතරට ගෙන යාම, තරුණයින් ස්වයං රැකියා ක්ෂේත්‍රය ට පෙළඹවීම හා ණය පහසුකම් ලබාදීම සඳහා වාණිජ බැංකු වලට යොමු කිරීම, පෞද්ගලික ආයතන හා ඒකාබද්ධ ස්වයං රැකියා ව්‍යාපෘති හඳුන්වා දීම, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දැනුම ලබාදීම යන පරමාර්ථ ඇතිව ජාතික තරුණ සේවා සභාව විසින් ''ව්‍යාපාරික තරුණයා'' නමින් විශේෂ අංශයක් 1978 දී ආරම්භ කරන ලදී. ''ව්‍යාපාරික තරුණයා '' අංශය මගින් ව්‍යාපාර කළමණාකරණ පුහුණුව ලබාදුන් තරුණයින් වාණිජ බැංකු වලට යොමු කරනු ලැබුව ද, එකී බැංකු , සම්ප්‍රදායික බැංකු නීතිරීති වලට අනුව ණය සඳහා ඇප ඉල්ලා සිටීම නිසා මෙම වැඩ පිළිවෙල සාර්ථක නොවීය.

මෙම ගැටළුවට පිළියමක් ලෙස ස්වයං රැකියා සඳහා ණය ලබාදීම පිණිස තරුණයින් ගේම ආර්ථික සංවිධානයක අවශ්‍යතාවය පැන නැගී තිබුණි. මැලේසියාවේ ''කොබේනා'' තරුණ සමූපකාරය පිළිබඳව කරන ලද අධ්‍යනය කින් පසු 1981.07.01 දින සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සමූපකාර සමිතිය නමින් 1972 අංක: 05 දරණ සමූපකාර සමිති පනත යටතේ තරුණයින් සඳහා වෙනම සමූපකාර සමිතියක් ලියාපදිංචි කරන ලදී.

මෙම තරුණ සමූපකාර සමිතිය මුළු දිවයින බල ප්‍රදේශය කරගත් සමූපකාර සමිතියක් වශයෙන් ජාතික තරුණ සේවා සභාවේ සංවිධාන රටාව යටතේ ක්‍රියාත්මක වූ අතර, ජාතික තරුණ සේවා සභාවේ නිලධාරීන් ගේ සේවය විශේෂ දීමනාවක් නොගෙවීමේ පදනම යටතේ ලබා ගන්නා ලදී. ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වලට අනුබද්ධව මෙම සමූපකාර සමිතියේ කාර්යාලයන් ද ක්‍රියාත්මක විය. ''නිස්කෝ'' යන්න මෙම සමූපකාර සමිතියේ ලියාපදිංචි වෙළඳ නාමය වූ අතර, තරුණයින් අතර වඩාත් ප්‍රචලිත වූයේ මෙම වෙළඳ නාමයයි. ස්වයං රැකියා වැඩ සටහන පුළුල්වීමත් සමග ජාතික තරුණ සේවා සභාවේ සමූපකාර අංශය නමින් වෙනම අංශයක් 1984 දී ආරම්භ කරන ලදී.

### ප්‍රාග්ධනය හා ව්‍යාපෘතිය

ජාතික තරුණ සේවා සභාවෙන් ලැබුන රුපියල් දශ ලක්ෂයක මූලික ප්‍රාග්ධනය කින් ඇරඹුන මෙම සමූපකාර සමිතියේ මුල් කාලයේ ප්‍රාග්ධනය වර්ධනය වූයේ සාමාජික කොටස් මුදල් හා සාමාජික හා සාමාජික නොවන තැන්පත් වලිනි.

1982 දෙසැම්බර් මාසයේ දී තරුණයින් සඳහා ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ආරම්භ කළ අතර, ණය දීම සඳහා සමිතියේ අරමුදල් ප්‍රමාණවත් නොවූයෙන්, නිස්කෝ වාසනා නමින් ලොතරැයියක් 1983 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. 1985 දක්වා ක්‍රියාත්මක කළ මෙම ලොතරැයියේ ලොතරැයි මාලා 05 කින් රුපියල් හැට ලක්ෂයකට (6,0,00,000/–) ආසන්න මුදලක් උපයා ගන්නා ලදී. පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ වැඩ සටහනින් හා බටහිර ජර්මනියේ ආයතනයකින් ආධාර හා ප්‍රදාන වශයෙන් රුපියල් තුන් ලක්ෂයක පමණ මුදලක් ද ලැබුණි. නිස්කෝ ස්වයං රැකියා වැඩ සටහන සාර්ථක වීමත් සමග විමධ්‍යගත මුදල් හා පලාත් සභා මුදල් ණය දීම සඳහා නිස්කෝ දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති වලට ලැබීම නිසා දැනට නිස්කෝ සංගමය හා දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති සතු මුළු ප්‍රාග්ධනය රුපියල් දසලක්ෂ 35 ක් පමණ වේ. මෙම මුදල් සාමාජිකයින්ට ණය නිකුත් කිරීම සඳහා පමණක් යොදා ගනු ලැබේ.

1990 වර්ෂය සඳහා දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති වලට ස්වයං රැකියා ණය දීම හා ඊට අදාල පුහුණු වැඩ සටහන් සඳහා විමධ්‍යගත හා පලාත් සභා අරමුදල් වලින් රුපියල් දසලක්ෂ දහයකට අධික මුදලක් ලැබී ඇත.

### විමධ්‍යගත කිරීම

තරුණයින්ට වඩාත් කාර්යක්ෂම සේවා සැපයීමේ අරමුණ ඇතිව 1985 වර්ෂයේදී සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සමූපකාර සමිතිය විමධ්‍යගත කර, සෑම පරිපාලන දිස්ත්‍රික්කයකටම එක් සමිතිය බැගින් දිස්ත්‍රික් සමූපකාර සමිති 25 ක් 1985. 07.02. දින ආරම්භ කරන ලදී. මෙම සමිති වල මුදුන් මට්ටමේ සංවිධානය වශයෙන් 1986.01.01 දින සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමය (නිස්කෝ) නමින් සමිති සංගමයක් පිහිටුවන ලදී. ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ වල නිස්කෝ ප්‍රාදේශීය කාරක සභා පිහිටුවා ඇති අතර, ස්වේච්ඡා පදනමින් ග්‍රාම සේවා නිලධාරී වසම් මට්ටමින් ව්‍යාපාරික හවුල් පිහිටුවා ඇත. නිස්කෝ තරුණ සමූපකාර ව්‍යාපාරයේ සංවිධාන ව්‍යුහය පහත දැක්වෙන ලෙස ජාතික මට්ටමේ සිට ගම් මට්ටම දක්වා ව්‍යාප්ත ව පවතී.

**අයාතන**

සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමය
දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති
ප්‍රාදේශීය කාරක සභා
ව්‍යාපාරික හවුල්

**මට්ටම**

ජාතික මට්ටම

දිස්ත්‍රික් මට්ටම
ප්‍රාදේශීය මට්ටම
ග්‍රාම සේවා නිලධාරී වසම්

නිස්කෝ සංගමය හා දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති, සමූපකාර නීතියට අනුකූලව සම්මත කරගත් අතුරු ව්‍යවස්ථා හා කාරක නියෝග වලට යටත්ව ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල විසින් පාලනය කරනු ලබයි. ප්‍රාදේශීය කාරක සභා වල කාරක සභිකයින් 09 දෙනාම තරුණයින් අතරින් තෝරා ගනු ලැබේ. දිස්ත්‍රික් සමිති වල අධ්‍යක්ෂ මණ්ඩලයේ 11 දෙනාගෙන් 07 දෙනෙකු සමිතියේ මහා සභාව විසින් සාමාජිකයින් අතුරින් පත්කරගනු ලැබේ. සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ 15 දෙනාගෙන් 09 දෙනෙකු දිස්ත්‍රික් සමිති නියෝජනය කරන සාමාජිකයින් අතරින් තෝරා ගැනේ. ව්‍යාපාරික හවුල්, නිස්කෝ සාමාජිකයින් ඇතුළු තරුණ ව්‍යාපාරිකයින් ගෙන් සමන්විත වේ. කෙසේ වුවද 1981/07/01 සිට 1990 ඔක්තෝම්බර් අවසානය වන විට මෙහි සාමාජිකයින් සංඛ්‍යාව 3,60,000 ද ඉක්මවා ඇත.

# විවිධ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රම

නිස්කෝ දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිති මගින් සාමාජිකයින්ට ණය සපයනු ලබන අතර, දිස්ත්‍රික් සමිති වල ඉල්ලීම පරිදි එම සමිති වල නිස්කෝ සංගමය මගින් ණය මුදල් සපයනු ලැබේ.

නිස්කෝ හා ඒකාබද්ධ වාණිජ බැංකු ණය යෝජනා ක්‍රම ආරම්භ කිරීමේ ප්‍රධාන පරමාර්ථය වූයේ, ස්වයං රැකියා සඳහා ණය ඉල්ලුම් කරන සියළුම තරුණ යින්ට ප්‍රමාද රහිතව ණය ලබා දීමට ඉඩ ප්‍රස්ථා සලසා දීම ය.

මෙම ඒකාබද්ධ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රම (ලංකා බැංකුව හා මහජන බැංකුව) යටතේ ණය නිකුත් කිරීමේ කාර්යය අදල බැංකු ශාඛා මගින් සිදු කරනු ලබන අතර, ණය පෙර විපරම් හා පසු විපරම් කාර්යය ජාතික තරුණ සේවා සභාවේ නිලධාරීන් ගේ සහාය ඇතිව ''නිස්කෝ'' දිස්ත්‍රික් තරුණ සේවා සමුපකාර සමිති මගින් ඉටු කරනු ලැබේ.

තරුණයින් හඳුනා ගැනීම, ව්‍යවසාය කත්ව සංවර්ධන පුහුණුව ලබාදීම, ව්‍යාපෘති වාර්තා හා ණය ඉල්ලුම් පත් නිර්දේශ කර බැංකුවට ඉදිරිපත් කිරීම හා ණය නිකුත් කිරීමෙන් පසු විවිධ දෙපාර්තමේන්තු හා ආයතන වල සේවා සම්බන්ධීකරණය, ණය වාරික අයකර දීම යන කාර්ය භාරයන් මෙම ඒකාබද්ධ ණය යෝජනා ක්‍රම යටතේ ජාතික තරුණ සේවා සභාව හා නිස්කෝ වෙත පැවරී ඇත. රැකියා විරහිත තරුණයින්ට ස්වයං රැකියා සඳහා ණය මුදල් ලබා ගැනීමට මෙම ණය යෝජනා ක්‍රම තුලින් විශාල පිටුවහලක් ලැබී ඇත. අදල බැංකු වල නිගමනය වනුයේ නිස්කෝ ඒකාබද්ධ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රම බැංකු මගින් ක්‍රියාත්මක කරනු ලබන සෙසු ණය යෝජනා ක්‍රම හා සසඳා බැලීමේ දී ප්‍රශස්ථ මට්ටමකින් ක්‍රියාත්මක වන බවයි.

බොහෝ විට ණය ඉල්ලුම් කරන නිස්කෝ සාමාජිකයින්ගේ කැමැත්ත හා ඉල්ලීම අනුව ණය ඉල්ලුම් පත් නිර්දේශ කර අදල බැංකු ශාඛා වලට ඉදිරිපත් කරනු ලැබේ. රැකියා විරහිත තරුණයින් ස්වයං රැකියා සඳහා වාණිජ බැංකු වලට යොමු කිරීමේ දී නිස්කෝ අතරමැදි ආයතනයක් ලෙස විශිෂ්ඨ සේවාවක් සිදු කරන බව ලංකා බැංකුව හා මහජන බැංකුව විසින් ප්‍රකාශ කර තිබේ.

### නිස්කෝ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය

මෙම ණය යෝජනා ක්‍රමය 1982 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ක්‍රියාත්මක කරනු ලැබූ අතර, 1990 ඔක්තෝම්බර් අවසානය වන විට ව්‍යාපෘති 6351 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 38·45 ක මුදලක් ණය වශයෙන් නිකුත් කර ඇත. දැනට සාමාන්‍ය ණය අයවීමේ ප්‍රතිශතය 78%ක පමණ සතුටුදයක මට්ටමක පවතී. අය කරනු ලබන වාර්ෂික පොලී ප්‍රතිශතය 15% කි. සාමාජිකයින් දෙදෙනෙකුගේ පෞද්ගලික ඇප මත රු. 15,000/– දක්වාද, ස්ථිර, චංචල දේපල හා සුරකුම මත රු: 30,000:– දක්වාද උපරිමයකට යටත්ව ණය නිකුත් කරනු ලබන අතර, නිස්කෝ''ස්විස් කන්ට්‍රැක්''ණය යෝජනා ක්‍රමය යටතේ රු: 75,000/– උපරිමයකට යටත්ව ණය නිකුත් කරනු ලැබේ.

### නිස්කෝ ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය

නිස්කෝ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵල යක් වශයෙන් 1985 වර්ෂයේ දී ලංකා බැංකුව හා ඒකාබද්ධව මෙම ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ නිස්කෝ සාමාජිකයෙකුට රු. 10,000/-ක උපරිමයකට යටත්ව ණය ලබාගත හැකි අතර, රු. 50,000/– උපරිමයකට යටත්ව කණ්ඩායම් ව්‍යාපෘති සඳහා ණය නිකුත් කරනු ලබයි. 1990 ඔක්තෝබර් මාසය වන විට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති 5498 ක් සඳහා රුපියල් දශලක්ෂ 4946 කමුදලක් ණය වශයෙන් නිකුත් කර ඇත. වාර්ෂික පොලී ප්‍රතිශතය 16% ක් වන අතර ණය අයවීමේ ප්‍රතිශතය 82% ක් පමණ වේ.

### නිස්කෝ මහජන බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය

1787 වර්ෂයේ දී ආරම්භ කරනු ලැබූ මෙම ණය යෝජනා ක්‍රමය වර්ෂ දෙකක කාලය තුල විශාල ප්‍රගතියක් පෙන්වා ඇත. 1990 ඔක්තෝම්බර් අවසානයට ව්‍යාපෘති 4,022 ක් සඳහා රු: දශලක්ෂ 46.06 මුදලක් ණය වශයෙන් නිකුත් කර ඇති අතර, වාර්ෂික පොලී ප්‍රතිශතය 16% කි. ණය අයවීමේ ප්‍රතිශතය 85%ක ඉතා සතුටුදයක මට්ටමක පවතී. ණය උපරිමය රු: 25,000/- ක් වේ.

### වෙනත් ණය යෝජනා ක්‍රම

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සමඟ ණය යෝජනා ක්‍රියාත්මක කළද පොලී ප්‍රතිශතය අධික වීම නිසා ව්‍යාපෘති 211 ක් සඳහා රු. දශලක්ෂ 1.23 ක් පමණක් මේ යටතේ නිකුත් කර ඇත. මීට අමතරව මාතර දිස්ත්‍රික් සංවර්ධන ඒකාබද්ධ ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 145 ක් සඳහා නිකුත් කර ඇති අතර, ජීව සංවර්ධන ආයතනය හා ඒකාබද්ධ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත.

### යෝජිත ස්වයං රැකියා ණය යෝජනා ක්‍රම

#### සී/ස හැටන් නැෂනල් බැංකුව

හැටන් නැෂනල් බැංකුව මගින් දැනට ක්‍රියාත්මක කරනු ලබන ''ගැමි පුබුදුව'' ණය යෝජනා ක්‍රමය යටතේ නිස්කෝ සාමාජිකයන්ට ස්වයං රැකියා ණය ලබා දීමට අපේක්ෂිතව ඇත. මෙම ණය 14% ක වාර්ෂික පොලියක් යටතේ රු: 25,000 ක උපරිමයකට යටත්ව නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

### ජාතික සංවර්ධන බැංකුව (සුමක ණය)

ජාතික සංවර්ධන බැංකුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා වූ ණය යෝජනා ක්‍රමයට (සුමක ණය) නිස්කෝ ඇතුලත් කර ගැනීම සඳහා මූලික සාකච්ඡා අවසන් කර ඇත. දැනට ව්‍යාපාර ආරම්භ කර ඇති නිස්කෝ සාමාජිකයින්ට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ස්වකීය ව්‍යාපාර පුළුල් කර ගැනීම සඳහා ණය ලබා දීමට අපේක්ෂා කෙරේ.

### ලෝක බැංකු ණය ආධාර

ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාවේ පිහිටුවීමට අපේක්ෂිත දුප්පත්කම තුරන් කරලීම සඳහා වූ අරමුදල යටතේ ඉදිරි පස් වසර තුල රුපියල් දශ ලක්ෂ 300 ක මුදලක් ප්‍රතිමූල්‍ය ණය වශයෙන් ලබා ගැනීමටත්, පුහුණු කටයුතු සඳහා ඊට අමතරව ආධාර ලබා ගැනීමටත් සැලසුම් ඉදිරිපත් කර ඇත. දැනට ක්‍රියාත්මක වන නිස්කෝ ස්වයං රැකියා වැඩ සටහන පිළිබඳව ලෝක බැංකු නියෝජිතයින් සිය ප්‍රසාදය පල කරන ලදී.

### ව්‍යවසායක සංවර්ධන පුහුණු පාඨමාලාව

ජාතික තරුණ සේවා සභාවේ සමූපකාර අංශයේ ප්‍රතිපාදන යටතේ තරුණයින් සඳහා ව්‍යවසායක සංවර්ධන පුහුණු පාඨමාලා සංවිධානය කරනු ලබන අතර කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහාය ඇතිව මෙම පාඨමාලා පවත්වනු ලැබේ. ණය ලාභීන් ව්‍යවසායකත්වය පිළිබඳ දැනුවත් කිරීම, මෙහි පරමාර්ථය වන අතර, මහජන බැංකුව විසින් මෙම පුහුණු පාඨමාලා සඳහා 1989/90 වර්ෂයේ රු: 645,000/- ක ආධාර මුදලක් සමූපකාර සංවර්ධන අරමුදලින් ලබා දෙන ලදී. 1990/91 වර්ෂය සඳහා මේ යටතේ රු: 1,700,000/- ක මුදලක් ලබා ගැනීමට සැලසුම් ඉදිරිපත් කර ඇත.

### ව්‍යාප්ති සේවා පුළුල් කිරීම

නිස්කෝ ස්වයං රැකියා වැඩ පිළිවෙල ගම් මට්ටමට ගෙන යාම සඳහාත්, ඊට අනුබද්ධ ග්‍රාමීය මට්ටමේ සංවිධාන කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහාත් තරුණ සේවා නිලධාරීන්ට පමණක් මෙම කාර්යය ඉටුකළ නොහැකි හෙයින් නායකත්ව ගුණාංග හා හැකියා වන් ඇති තරුණ තරුණියන් තෝරා ගෙන ඔවුන්ට විධිමත් පුහුණුවක් ලබා දී ව්‍යවසායකත්ව සංවර්ධන සහායකයින් වශයෙන් පත් කිරීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

මහජන බැංකුවේ සහාය ඇතිව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මෙම වැඩ සටහන ක්‍රියාත්මක වන අතර, ජනසවිය වැඩ සටහන ක්‍රියාත්මක වන ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ 18ක නොවැම්බර් මාසයේ සිට මොවුන් පත්කර ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශේෂ ස්වයං රැකියා සංවර්ධන වැඩ සටහනට අදාලව දැනටමත් තරුණ තරුණියන් සියයකට අධික ප්‍රමාණයක් පුහුණු කර එම කාර්ය යෙහි යොදවා තිබේ. ව්‍යවසායකත්ව සංවර්ධන සහායක තනතුරු ද ස්වයං රැකියා මට්ටමින් ආදායම් ලබාගත හැකි ස්වයං රැකියාවක් බවට පත් කිරීමට අපේක්ෂිතය.

ව්‍යවසායකත්ව සංවර්ධන සහායකයින් පත් කිරීමක් සමඟ ව්‍යාපාරික හවුල් ප්‍රතිසංවිධානය කර කණ්ඩායම් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ. විමධ්‍යගත හා පලාත් සභා මුදල් නිස්කෝ දිස්ත්‍රික් සමිති වලට ගලා ඒම සමග ඒවායේ කළමනාකරණය විධිමත් කිරීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී.

### ජන සවිය ආශ්‍රිත නිස්කෝ ස්වයං රැකියා වැඩ සටහන

ජනසවිය ආශ්‍රිත පවුල් වලින් නිස්කෝ සාමාජිකයින් බඳවා ගැනීම, ව්‍යවසායක පුහුණුව ලබා දීම හා ස්වයං රැකියා සඳහා ණය ලබා දීමේ වැඩ සටහනක් ජනසවිය ක්‍රියාත්මක වන ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ වල ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ ජනසවි පවුල් වලින් තරුණ තරුණියන් 12,478 දෙනෙකු නිස්කෝ සාමජිකයින් වශ යෙන් බඳවා ගෙන ඇති අතර ග්‍රාමීය මට්ටමේ මූලික අවබෝධය ලබා දීමේ වැඩ සටහන් 217 ක් පවත්වා ඇත. මෙම තරුණ තරුණියන් සඳහා ව්‍යවසායක සංවර්ධන පුහුණු පාඨමාලා 40 ක් පවත්වා ඇති අතර, ඔවුන් ගෙන් ණය අයදුම් පත් 826 ක් ලැබී තිබේ. දැනට 327 දෙනෙකුට රු: 2,782,000/-ක මුදලක් ස්වයං රැකියා සඳහා ණය වශයෙන් ලබා දී ඇත.

### සමාගම් පිහිටුවීම

නිස්කෝ සංගමය, තරුණ දිස්ත්‍රික් සේවා සමූපකාර සමිති හා නිස්කෝ සාමාජිකයින් ගේ සහභාගිත්වය ඇතිව තරුණයින්ට ස්වයං රැකියා අවස්ථා සැලසීම සඳහා සමාගම් පිහිටුවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. නොරාඩ් ආධාර ඇතිව මොනරාගල කිතුල්කොටේ රට උළු නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා ''සී/ස රණමයුර ටයිල්ස්'' නමින් සමාගමක් ලියා පදිංචි කර ඇති අතර, පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ වැඩ සටහන යටතේ ලද ආධාර මත කළුතර පොහොද්දර මුල්ලේ සී/ස යුනිකොයාර් නමින් කොහු ආශ්‍රිත නිෂ්පාදන සමාගමක් පිහිටුවා ඇත. මෙම සමාගමේ කටයුතු දැනට සාර්ථකව ක්‍රියාත්මක කෙරේ. ඉදිරියේ දී ද කණ්ඩායම් ව්‍යාපෘති සඳහා සමාගම් ලියාපදිංචි කිරීමට අපේක්ෂිතය.

රත්නපුර දිස්ත්‍රික්කයේ කළවාන කොඩිප්පිලිකන්ද නැමැති ගමේ පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ වැඩ සටහන යටතේ ලැබී ඇති රු. 100,000/- ක මුදලින් තේ පැල තවාන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මීට අමතරව දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති විසින් නිස්කෝ යටතේ විවිධ පුහුණු පාඨමාලා ද සංවිධානය කර තිබේ.

### සමීක්ෂණ ව්‍යාප්ති සේවා අලෙවි ප්‍රවර්ධන කටයුතු

දැනට ක්‍රියාත්මක කර ඇති ස්වයං රැකියා ව්‍යාපෘති හා තරුණ සේවා වියුක්තිය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහාය ඇතිව කුරුණෑගල හා රත්නපුර දිස්ත්‍රික්කය ආශ්‍රිතව සමීක්ෂණයක් පවත්වා ඇති අතර ඉදිරි මාසය තුල එහි වාර්තාව නිකුත් කිරීමට අදහස් කෙරේ. 1991 වර්ෂය තුලදී ද මෙවැනි සමීක්ෂණ සැලසුම් කර ඇත.

ස්වයං රැකියා ව්‍යාපෘති පිළිබඳව තරුණයින්ටදැනුම ලබාගැනීමට උපකාරී වීම සඳහා වීඩියෝ කැසට් පට නිපද වීමට ද සැලසුම් කර ඇත. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහාය ඇතිව තරුණ සේවා නිලධාරීන්ට ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා දීමටත්, ඔවුන් එම ක්ෂේත්‍රය තුල ව්‍යාප්ති නිලධාරීන් ලෙස පත් කිරීමටත් පියවර ගෙන තිබේ.

ව්‍යාපෘති පසුහාර කටයුතු සඳහා දැනට ඇති ප්‍රධාන ගැටළුවක් වනුයේ නිලධාරීන් ප්‍රමාණවත් නොවීම හා ඔවුන්ට ප්‍රවාහන පහසුකම් නොමැතිවීමයි. වාණිජ බැංකු වල අනුග්‍රහය ඇතිව ව්‍යවසායකත්ව සංවර්ධන සහායකයින්ට පාපැදි මිලදී ගැනීමට පොලී රහිත ණය මුදල් ලබා දීමටත් නිස්කෝ සාමාජිකත්ව ලබා ඇති තරුණ සේවා නිලධාරීන්ට යතුරු පැදි මිලදී ගැනීමට ණය ලබා දීමටත්, දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති වල සාමාන්‍යාධිකාරි වරුන්ට යතුරු පැදි ලබා ගැනීමට නිස්කෝ සංගමයෙන් දිස්ත්‍රික් සමිති වලට ණය මුදල් ලබා දීමටත් පියවර ගෙන ඇත. අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා කුඩා ව්‍යාපාරික පොළවල් පැවැත්වීමට හා ග්‍රාමීය පොළවල් වල ඉඩ පහසුකම් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

### දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති ස්වාධීන ආයතන බවට පත් කිරීම

දැනට ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධව ක්‍රියාත්මක වන දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති, ඒවායේ ආර්ථික ශක්‍යතාවය මත සිය කාර්ය මණ්ඩලයක් සහිතව ආර්ථික ඒකක ලෙස ස්වාධීනව පවත්වා ගෙන යාමට හැකිවන සැලැස්මක් 1991 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ.

### වෙනත් රැකියා අවස්ථා සලසා දීම

මහජන බැංකුව හා ඒකාබද්ධව ණය පසු විපරම් කිරීම සඳහා ක්ෂේත්‍ර සහායක වරු වශයෙන් නිස්කෝ සාමාජිකයින් බඳවා ගැනීමේ වැඩ පිළිවෙලක් දැනටමත් ක්‍රියාත්මක කර ඇත. මොවුන්ට රු. 500/– ක මාසික දීමනාවක්ද, අයකර ගනු ලබන පොලියෙන් නිශ්චිත ප්‍රතිශත යක්ද මහජන බැංකුවේ අනුග්‍රහය යටතේ ගෙවනු ලැබේ. ජාතික තරුණ සේවා සභාවේ යතුරු ලියන පාඨමාලා හදාරා ඇති නිස්කෝ සාමාජිකයින් මහජන බැංකුවේ යතුරු ලියන්නියන් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ වැඩ පිළිවෙලක්ද දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. කුරුණෑගල දිස්ත්‍රික්ක යේ නිස්කෝ සිහිති පාසැල් ව්‍යාපෘතිය යටතේ තරුණියන් 250 දෙනෙකු පමණ මොන්ටිසෝරි ගුරුවරියන් ලෙස ස්වයං රැකියා වල යෙදී සිටී.

### නිස්කෝ ස්වයං රැකියා වැඩ සටහන පිළිබඳ ඇගයීම

නිස්කෝ තරුණ සමූපකාර ව්‍යාපාරය හා ඒකාබද්ධ ස්වයං රැකියා වැඩ සටහන පිළිබඳව කැනඩාවේ කෝඩ් විශ්ව විද්‍යාලයේ ආචාර්ය, චාල්ස් හෙන්රිකස් විසින් විශේෂ අධ්‍යයනයන් දෙකක් කර ඇත.

ශ්‍රී ලංකාවේ දුප්පත්කම තුරන් කරලීම සඳහා ආධාර දීම පිණිස ලෝක බැංකුව විසින් මෑත දී, සමීක්ෂණයක් කර ඇති අතර, එම වාර්තාවේ නිස්කෝ පිළිබඳව මෙසේ සඳහන් වේ.

> ''නිස්කෝ යනු විරැකියාවෙන් පෙලුන තරුණ පිරිසකට රැකියා මාර්ග ඇති කර ගැනීම පිණිස උදව් උපකාර කරන්නාවූත්, ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කරන ලද්දාවූත් අති සාර්ථක වූත් විශාල වැඩ සටහනකි. මෙය ජාතික තරුණ සේවා සභාව සමඟ අත්වැල් බැඳ දිවයිනේ අස්සක් මුල්ලක් නෑරම ව්‍යාප්තව පවතී. රැකියා විරහිත තරුණ පිරිසට ස්වයං රැකියාවන්ට යොමු කරවීම පිණිස, මහඟු උත්සාහයක් ගන්නා 'නිස්කෝ' ඒ සම්බන්ධව දිවයිනේ ප්‍රමුඛ ආයත නය බවට පත්ව ඇත''

පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ වැඩ සටහන මඟින් කර ඇති අධ්‍යයන වාර්තාවක ද ''නිස්කෝ'' පිළිබඳ ඇගයී මක් කර ඇති අතර, රැකියා විරහිත තරුණයින් සඳහා ස්වයං රැකියා තොරතුරු මධ්‍යස්ථාන ඇරඹීමේ යෝජනා වක් ද පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ වැඩ සටහන මගින් ඉදිරිපත් කර ඇත. මෙම යෝජනාව එකී සංවිධානය විසින් ගෙන ඒමට ප්‍රථම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ස්වයං රැකියා තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබීම 1991 ජනවාරි මාසයේ පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ වැඩ සටහන වෙනු වෙන් අධ්‍යයන චාරිකාවක යෙදුන, බ්‍රිතාන්‍ය යේ ඩර්හැම් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අංශයේ අධ්‍යක්ෂ, මාර්ක් හාවර්ඩ් මහතාගේ විශේෂ පැසසුමට ලක් වී ඇත.

නිස්කෝ දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති වලින් 80% ක් පමණ නිස්කෝ දිස්ත්‍රික් තරුණ සේවා දැනට ලාභදායි තත්වයෙන් පවත්වා ගෙන යනු ලැබේ. උතුරු නැගෙනහිර පලාත්වල (අම්පාර හැර) දිස්ත්‍රික් තරුණ සේවා සමූපකාර සමිති වල කටයුතු වසර කිහිපයක සිට එහි පවතින වාතා වරණය යටතේ අඩාලව පවතී. නිස්කෝ තරුණ සමූපකාර සමිති ව්‍යාපාරය කෙටි කාලයක් ඇතුලත මෙරටේ පුළුල් සමූප කාර සමිති ව්‍යාපාරයක් බවට පත්වීමෙන් ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය තුළ නව නැම්මක් ඇති කරන ලදී. විශේෂ යෙන්ම සමූපකාර සමිති ව්‍යාපාරය තුළ තරුණ නායකත්වයක් බිහි කිරීම පිළිබඳව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රශංසාවට ලක්ව ඇත.

ජාතික තරුණ සේවා සභාවේ සහකාර අධ්‍යක්ෂ (සමූපකාර)

**සෝමපාල පතිරණ විසිනි.**